මොරටුව අඟුලානේ උත්සව ශාලාවක, වයස් අවුරුදු 15 ක බාලවයස්කාර දැරියක් සහ වයස අවුරුදු 19 ක පුද්ගලයෙකු අතර විවාහයක් පැවැත්වීම පිළිබඳව ළමාරක්ෂක අධිකාරියට ලැබුණු ඔත්තුවක් මත පොලිසිය විසින් එම පුද්ගලයාව, නීත්‍යානුකූල භාරකාරත්වයෙන් බාලවයස් දැරියක අපහරණය කිරීමේ චෝදනාව මත අත්අඩංගුවට ගැනුණු බව මාධ්‍ය සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් වාර්තා කරනා පුවත්පත් දෙකක සිරස්තල අපි මෙසේ ඉදිරිපත් කරමු.

"චූටි මනාලියගේ මඟුලට පොලිසියෙන් පනී" - අරුණ
"දෙපාර්ශවයේ කැමැත්තෙන් සිදුවන්න ගිය බාලවයස්කාර විවාහයක් පොලිසිය නවතයි, මනාලයා අත්අඩංගුවේ" - අද

1) අරුණ සිරස්තලය මගින්, මෙය විවාහ වීමට නීතියෙන් අවසර නොමැති බාලවයස්කාර දැරියක නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කොට සිදු කරනු ලැබූ නීතිවිරෝධී කටයුත්තක් බව හැඟවෙතැයි ඔබ සිතන්නේ ද?

2) අරුණ පුවත හා පළ වී ඇති කාටූනය ඔස්සේ, මෙම සිදුවීමට භාවාතිශය (Sensational) මුහුණුවරක් ලබාදී තිබේ යැයි ඔබ නොසිතන්නේ ද?

3) ඒ අනුව ඔබ තෝරාගන්නේ වඩාත් යෝග්‍ය යැයි තෝරාගන්නේ මින් කුමන පුවත් වාර්තාව ද?